අතීතයේ අප සමාජය තුළ භාවිතාවේ පැවතුණු "හාම්පුතා" වැනි යෙදුම් වර්තමානය වන විට භාවිතා වනු දැකිය හැක්කේ කලාතුරකිනි. ඊට ප්‍රධාන හේතුව වන්නේ, "හාම්පුතා" යන යෙදුම ඔස්සේ නිරූපණය වන පසුගාමී ස්වාමි-සේවක සබඳතාවය වර්තමානය වන විට අභාවයට ගොස්, මේ වන විට වඩාත් වෘත්තිමය වන සේවක-සේව්‍ය සබඳතාවයක් බිහිවී තිබීමයි. උදාහරණයක් ලෙසින් දක්වන්නේ නම්, 'ශ්‍රී ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය' (The Employer's Federation of Ceylon) පවා වත්මනේදී 'ලංකා සේව්‍ය සම්මේලනය' ලෙසින් නැවත නම් කෙරී ඇත.

සේවා ස්ථානයක සේවය කරමින් සිටි බව කියන තරුණියකට එම සේවා ස්ථානය අයත් ව්‍යාපාරිකයා විසින් ලිංගික අතවර කළ බවට පැවසෙන පුවතක් මව්බිම සහ අරුණ පුවත්පත් තුළ (10/14) දක්නට ලැබිණි.

මව්බිම සිරස්තලය - තරුණියකට අතවර කළ කුලියාපිටියේ ව්‍යාපාරිකයා අත්අඩංගුවට
අරුණ සිරස්තලය - දහනවයේ සේවිකාව පැහැරගෙන ගොස් අතවර කළැයි හාම්පුතා අත්අඩංගුවට

එසේම අරුණ පුවත තුළ මෙම කියනා සිදුවීම කාටූනයකින්ද දක්වා තිබිණි.

1) මෙම වාර්තාකරණයන් දෙකෙන්, ඔබ වඩාත් යෝග්‍ය යැයි තෝරා ගන්නේ මව්බිම සිරස්තලයද? නැතිනම් අරුණ සිරස්තලයද?

2) අරුණ පුවත් වාර්තාව හා ඉදිරිපත් වන කාටූනයෙන් සිදුවීම භාවාතිෂය ලෙසින් දැක්වීමක් සිදුවෙතැයි ඔබ සිතන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Aruna**